# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2376/12 – 2024 මාර්තු මස 19 වැනි අඟහරුවාදා – 2024.03.19**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2019/126.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.02.22 දිනැති හා අංක 2320/54 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.02.17 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පයාගල, හල්කඳවිල, ඇඩ්වින් වීරසේන මාවත හි පදිංචි ඩී. කුලරත්න මයා සහ කොළඹ 05, නාරාහේන්පිට, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A27/2023 හා 2024.02.16 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල් *(වැ.බ.)*

2024 මාර්තු මස 06 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

අයි. ආර්. අංකය - අයි/ආර්/කොම්/01/2019/126.
බේරුම්කරණ නඩු අංකය - ඒ/27/2023.

ඩී. කුලරත්න මහතා
ඇඩ්වින් වීරසේන මාවත,
හල්කඳවිල,
පයාගල.

*පළමු පාර්ශ්වය*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
අංක 200, කිරුළ පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

*දෙවන පාර්ශ්වය*

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින ආරාවුල සම්බන්ධයෙන් ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය ප්‍රකාරව තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එම ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බත්තරමුල්ල, පැලවත්ත, සිංහපුර පාරේ, අංක 117 හි පදිංචි සිරි සිංගප්පුලි වන මා පත්කොට ඇත.

**බේරුම් කළයුතු කරුණු**

කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ අංක අයිආර්/කොම්/01/2019/126 සහ 2023.01.31 දාතම සහිත යොමුවෙන් දක්වා ඇති පරිදි බේරුම් කළයුතු කරුණු වනුයේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කළ ඩී. කුලරත්න නමැති අයට වයස අවු. 57 න් පසු 2014.03.14 සිට 2017.03.14 දක්වා කාලය තුළ සේවය කිරීමට අවස්ථාව ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද? යන්න සහ එවැන්නක් සිදුව ඇත්නම් ඔහුට ලබා දියයුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ.

**පාර්ශ්වයන් වෙනුවෙන් පෙනී සිටීම**

අදාළ බේරුම්කරණ විභාගය හමුවේ ඉල්ලුම්කාර පළමුවන පාර්ශ්වය වෙනුවෙන් පී. එම්. තිලකසිරි යන අය ද දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ චිරස්ති සෙනෙවිරත්න, නීති නිලධාරි ශානිකා ගාල්ලගේ, නීතිඥ අමන්දා වත්තෙගම යන අය පෙනී සිටින ලදී.

**ආරාවුලේ පසුබිම**

පළමු පාර්ශ්වයේ 2023.03.13 දිනැති පළමු ප්‍රකාශයෙන් දක්වා තිබුනේ අළුත්ගම ලංගම ඩිපෝවේ ඩිපෝ පරීක්ෂකවරයකු ලෙස සේවය කරමින් සිටියදී අංක ශ්‍රී ලංගම/අළු/පා/06/2012 සහ 2013.12.14 දින දරන ලිපිය නිකුත්කොට වයස අවු. 57 සම්පූර්ණ වීම නිසා 2014.03.13 දින ඩිපෝ කළමනාකරු විසින් තමා විශ්‍රාම ගන්වන ලද බවයි.

එසේ විශ්‍රාම ගන්වන 2014.03.14 දින වන විට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය නිකුත් කරන ලද 2013.01.15 සහ 01/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය නිකුත්කර තිබුන බවත් ඒ අනුව අවු. 55 ඉක්මවා සේවයේ යෙදීමට රාජ්‍ය ව්‍යවසායන්හි සේවයේ නිරත සේවකයින් අපේක්ෂා කරන්නේ නම් සේවා දීර්ඝ කිරීමේ ඉල්ලීමකින් තොරව අවු. 60 දක්වා සේවයේ රැඳී සිටීමට එවැන්නකුට හැකි යැයි එහි සඳහන් කර තිබුන බවයි.

අංක 1/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ ප්‍රතිපාදන ශ්‍රී ලංගමයට අදාළ කර ගනිමින් ලංගම සේවකයින් විශ්‍රාම ගැන්විය යුතු බවට 2013.08.23 දින පැවති එහි අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලද බවත් 2013.10.14 දින ශ්‍රී ලංගම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පාලන) නිකුත්කර ඇති 2013 අංක 03 දරන චක්‍රලේඛය මගින් එය ප්‍රකාශයට පත්කරන ලද බවත් එහි සඳහන්ය.

ලංගම සේවකයින් විශ්‍රාම ගැන්වීමේ වයසට අදාළ අංක 1/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය පාදක කරගෙන ලංගමය නිකුත් කර තිබූ 2013 අංක 03 දරන චක්‍රලේඛය අවලංගු කර ශ්‍රී ලංගම මානව සම්පත් කළමනාකරණ කොට්ඨාසය 2015 අංක 1 දරන චක්‍රලේඛය නිකුත් කර ඇති බවත් පළමු පාර්ශ්වය තවදුරටත් දක්වයි.

එම චක්‍රලේඛය 2013.09.01 දින සිට ක්‍රියාත්මක බවත් ඒ අනුව වයස අවුරුදු හැට දක්වා සේවයේ යෙදීමට ඉඩ ලබා දී තිබුන බවත් ඊට අවස්ථාව ලබාදෙන ලෙස දෙවන පාර්ශ්වයෙන් ඉල්ලා සිටි බවත් සාධාරණයක් ඉටු නොවන හෙයින් 2014.03.14 දින සිට 2017.03.14 දින දක්වා හිඟ වැටුප් ලබාදෙන ලෙස නියෝගය කරන්නැයි ඉල්ලා කම්කරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටි බවත් දක්වා ඇත.

දෙවන පාර්ශ්වය 2023.04.10 දින මීට අදාළව මූලික ප්‍රකාශය ඉදිරිපත් කරමින් යට දැක්වෙන කරුණු සළකා මෙය මුල් අවස්ථාවේදීම නිෂ්ප්‍රභ විය යුතු බව දක්වන ලදී.

(අ) විශ්‍රාම ගොස් ඇති සේවකයකු සම්බන්ධ ගැටළුවක් විභාග කිරීමට මෙම බේරුම්කරන අධිකාරයට බලය නොමැති බව.

(ආ) මෙම ආරාවුලට අදාළ නිමිත්ත පැන නැගී ඇත්තේ මීට වසර 10 කට පමණ පෙර 2014.03.13 දින සිට බවත් ඒ අනුව මෙය කාලාවරෝධය වී ඇති බව.

(ඇ) විශ්‍රාම ගැන්වීමට එරෙහි ආරාවුලක් පැවතියේ නම් කාර්මික ආරාවුල් පනතේ නෛතික ප්‍රතිපාදන ප්‍රකාරව කම්කරු විනිශ්චය අධිකාරිය වෙත ඉල්ලුම්පතක් ගොනු කිරීමේ හිමිකම පැවතිය ද පළමු පාර්ශ්වය එම නෛතික ක්‍රියාමාර්ගයට අවතීර්ණ නොවී එය කාර්මික අධිකරණය වෙත යොමු කිරීමට අධිකරණමය බලයක් නොමැති බව.

මෙම මූලික විරෝධතා තුන සම්බන්ධයෙන් පහත දැක්වෙන තීරණයන් ගෙන ඇත:

(අ) 2014.03.14 දින විශ්‍රාමයාමෙන් පසු පළමු පාර්ශ්වයට කෙළින්ම බලපාන ලද 2015.03.18 දිනැති 2015 අංක 1 දරන ලංගම මානව සම්පත් චක්‍රලේඛය නිකුත් කර තිබුනි. ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මකවීමට ඔහුට පූර්ණ අයිතියක් ඇති හෙයින් ද එතැන් සිට ඔහු ඒ මත අඛණ්ඩව ක්‍රියාත්මකව ඇති හෙයින් ද කාර්මික ආරාවුල් පනත අනුව සේවය අවසන් කර ඇති පුද්ගලයකු පවා සේවකයා යන අර්ථකථනයට ඇතුලත් වන බව දක්වා ඇති හෙයින් ද විශ්‍රාම ගොස් ඇති සේවකයකුගේ ආරාවුලක් බේරුම් කිරීමට මෙම බේරුම්කරණයට බලය නැත යන විරෝධය ප්‍රතික්ෂේප කරමි.

(ආ) 2015.03.18 දින දරන ලංගම මානව සම්පත් චක්‍රලේඛය නිකුත්වීමෙන් පසු තම සේවය දීර්ඝ කරන ලෙස ඉල්ලා 2015.06.17 දින ලංගමය වෙත ලිපි යොමු කර ඇති බව අග්‍රාමාත්‍ය සම්බන්ධීකරණ ලේකම්ගේ 2015.08.04 දරන ලිපිය (පැ 05 - ලිපි ගොනුවේ පිටු අංක 24) තහවුරු කරන හෙයින් ද 2015.06.26 දින කලුතර සහකාර කම්කරු කොමසාරිස් වෙත මෙම දුක් ගැනවිල්ල වාර්තා කර ඇති හෙයින් ද වර්තමාන බේරුම්කරන නඩුව එහි දිගුවක් වන හෙයින් ද මෙය දස වසරකට ආසන්න කාලයක් පැරණි සිදුවීමක් බව දක්වා කාලාවරෝධයට යටත්ව බව පවසන දෙවන විරෝධය ද ප්‍රතික්ෂේප කරමි.

(ඇ) කාර්මික අධිරණය වෙත යොමු කර ඇති දුක්ගැනවිල්ලක් ප්‍රතික්ෂේප කරන්නට විධිවිධාන සළස්වා නොමැති හෙයින් තෙවන විරෝධය ද ප්‍රතික්ෂේප කරමි.

අවු. 55 සම්පූර්ණවීම නිසා පළමු පාර්ශ්වය 2012.03.13 දින විශ්‍රාම ගැන්විය යුතුව තිබුන ද 2011.04.29 අංක 60 දරන රාජ්‍ය ව්‍යාපාර ච. ලේ. ප්‍රතිපාදන අදාළ කර ගැනීම මත අවු. 57 දක්වා සේවය නිම කිරීමෙන් පසු 2014.03.14 දින සිට ගමනාගමන මණ්ඩලයීය සේවයෙන් විශ්‍රාම ගන්වන බව 2013.03.12 දිනැති ලිපියෙන් ඉල්ලුම්කරුට දන්වා ඇති බවත් ඊට එරෙහිව විරෝධයක් හෝ අභියාචනයක් පළමු පාර්ශ්වය ඉදිරිපත් කර නැති බවත් දන්වා ඇත.

2013.10.14 සහ 2013 අංක 3 දරන සේවක මණ්ඩල කොට්ඨාස චක්‍රලේඛ ලිපිය ප්‍රකාරව 2011.05.01 න් පසු වයස 55 වෛකල්පික විශ්‍රාම නොගොස් අවු. 57 දක්වා සේවය කරන සේවකයින්/නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය හා සේවා අවශ්‍යතාවය යන කරුණු සළකා අවු. 60 දක්වා වසරින් වසර සේවා දිගු ලබා දීමට මණ්ඩලය කටයුතු කරන බව ද පළමු පාර්ශ්වයට විනයානුකූල දඬුවම් ලබා දී ඇති බව ද අභ්‍යන්තර විනය පරීක්ෂණ පවත්වා අවවාද කිරීම්වලට ලක්ව ඇති බව ද කාර්ය සාධන වාර්තාවට අනුව සුදුසුකම් සපුරා නැති බවද තවදුරටත් දක්වා තිබේ.

2014.03.13 දින ඉල්ලුම්කරු විශ්‍රාම ගන්නා අවස්ථාවේ ශ්‍රී ලංගමය තුළ නිකුත් වී ඇති චක්‍රලේඛ අනුව නිවැරදි ලෙස පළමු පාර්ශ්වය සම්බන්ධයෙන් කටයුතු කර ඇති බවත් සියලු ව්‍යවස්ථාපිත හිමිකම් ඔහුට ලබා දී ඇති බවත් 2017.03.24 දින දක්වා සේවය කිරීමට පළමු පාර්ශ්වයට හිමිකම නැති බවත් තවදුරටත් දක්වා ඇත.

පළමු පාර්ශ්වය රියැදුරකු ලෙස සේවය කරන සමයේ ඔහුට එරෙහිව විනයානුකූල කටයුතු සිදු කර ඇත ද ඔහු ඩිපෝ පරීක්ෂක තනතුරට උසස්වීමෙන් පසු විනයානුකූල දඬුවමකට යටත් කර ඇති බවක් බේරුම්කරණය හමුවේ ඔප්පු කර නැත.

පළමු පාර්ශ්වයේ නඩුව ගොඩ නගා ඇත්තේ 01/2013 අංක 1 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාර ඉල්ලීමකින් තොරව වයස 60 දක්වා අනිවාර්ය සේවයේ යෙදීමට එම පාර්ශ්වයට අයිතිය හිමිව තිබූ බව පදනම් කරගෙනය.

01/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ උපදෙස් අනුව යැයි දක්වමින් ලංගමය 2013 අංක 3 දරන මානව සම්පත් චක්‍රලේඛය නිකුත් කර තිබුණ ද රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ ප්‍රධාන කොන්දේසිය එලෙසම පිළිගන්නට එමගින් කටයුතු කර තිබුනේ නැත.

මතුව පැවති විරෝධයන් නිසා 2013 අංක 3 දරන මානව සම්පත් චක්‍රලේඛය යටපත් කර 2015 මාර්තු 18 දින 2015 අංක 1 දරන මානව සම්පත් කළමනාකරණ චක්‍රලේඛය නිකුත්කර එහි ප්‍රතිපාදන ක්‍රියාත්මක කරන්නට පියවර ගෙන තිබුනේ ය.

එම චක්‍රලේඛයේ ද අඩුපාඩු පැවති හෙයින් 2015.03.27 දින 2016 අංක 1 (01) නමැති තවත් මානව සම්පත් චක්‍රලේඛයක් නිකුත් කර ඇත.

ලංකා ගමනා ගමන මණ්ඩලය නිකුත්කර ඇති මෙම චක්‍රලේඛයන් හි අන්තර්ගත ඇතැම් කරුණු එකිනෙකට පටහැනි හෙයින් පළමු පාර්ශ්වය විශ්‍රාමයාමත් සමග එම චක්‍රලේඛවල දැක්වෙන කරුණු බලපා ඇති ආකාරය විමසා බලා තීරණයකට එළැඹිය යුතුය.

**බේරුම්කරණ තීන්දු ප්‍රකාශය හෙවත් ප්‍රදානය**

රාජ්‍ය ව්‍යවසායන් හි සේවක විශ්‍රාම ගැන්වීමවලට අදාළව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය 01/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය නිකුත් කර තිබුණි. එම චක්‍රලේඛයේ අංක 1 යටතේ මෙසේ සඳහන් විය.

රාජ්‍ය ව්‍යවසායන් හි සේවකයින්ගේ වෛකල්පික විශ්‍රාම ගැන්වීමේ වයස අවු. 55 ක් වන අතර කිසියම් නිලධාරියකු වයස අවු. 55 ඉක්මවා සේවයේ යෙදීමට අදහස් කරන්නේ නම් සේවා දීර්ඝ කිරීමේ ඉල්ලීමක් නොමැතිව වයස අවු. 60 දක්වා සේවයේ රැඳී සිටිය හැක.

එකී චක්‍රලේඛය පදනම් කරගෙන 2013 අංක 3 දරන මානව සම්පත් චක්‍රලේඛය නිකුත් කරන්නට 2013.08.23 දින ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුන ද රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ අංක 1 දරන වගන්තියෙන් දක්වා තිබූ ඉල්ලීමකින් තොරව වයස 60 දක්වා එසේ රැඳී සිටිය හැකි බවට වන සඳහන 2013 අංක 3 දරන මානව සම්පත් චක්‍රලේඛයෙ හි දක්වා තිබුනේ නැත.

එහි අංක 1 යටතේ විශ්‍රාම ගන්වන වයස අවු. 60 වශයෙන් සළකන බව දක්වා ඇත්තේ 1975.04.04 දිනට ප්‍රථම ශ්‍රී ලංගමයට බැඳී ඇති සේවකයිනට පමණකි. මෙම නඩුවේ පළමු පාර්ශ්වය ලංගම සේවයට බැඳී ඇත්තේ 1981.04.24 දිනවන හෙයින් එම ප්‍රතිපාදනය ඔහුට අදාළ වී නැත.

එම චක්‍රලේඛයට අනුව පළමු පාර්ශ්වයට අදාළ වන්නේ 1975.04.04 දිනෙන් පසු සේවයට බැඳී ඇති සේවකයින්ට අදාළ කාර්යය පටිපාටිය දක්වන එහි අංක 3 යටතේ දක්වා ඇති ප්‍රතිපාදනය වුවද ඊට අදාළව අභියාචනයක් කරන්නට පළමු පාර්ශ්වය කටයුතු කර නැත.

01/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මුඛ්‍ය අර්ථය නිරූපනය වන ආකාරයට මෙම ලංගම චක්‍රලේඛය නිකුත් කර තිබීම නිසා ගමනාගමන මණ්ඩලය තුළ මතුව පැවති විරෝධතාවයන් සළකා 2013 අංක 03 දරන මානව සම්පත් චක්‍රලේඛය අවලංගු කරන්නටත් ඒ වෙනුවට 2015 අංක 1 දරන ශ්‍රී ලංගම මානව සම්පත් කළමනාකරණ චක්‍රලේඛය 2013.09.01 දින සිට බලපවත්වන පරිදි ක්‍රියාත්මක කරන්නටත් පියවර ගෙන තිබේ.

එම චක්‍රලේඛයේ සඳහන් කොන්දේසි ක්‍රියාත්මක කිරීමට අදාළව 2015 අංක 1 (01) දරන මානව සම්පත් කළමනාකරණ චක්‍රලේඛය නිකුත්කර ඇත.

එම චක්‍රලේඛයේ අංක 2 න් දක්වා ඇත්තේ 01/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක දින සිට ශ්‍රීලංගම සේවකයින්ගේ වෛකල්පික විශ්‍රාම ගැන්වීමේ වයස අවු. 55 වන අතර කිසිවකු එම වයස ඉක්මවා සේවයේ යෙදීමට අපේක්ෂා කරන්නේ නම් සේවා දීර්ඝ කිරීමේ ඉල්ලීමක් නොමැතිව අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස අවු. 60 දක්වා සේවයේ යෙදී සිටිය හැක යනුවෙනි.

එම චක්‍රලේඛයේ අංක 02.1 හි දක්වා ඇත්තේ 2011.04.29 දින නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 60 අනුව වයස අවු. 57 න් විශ්‍රාම ගැන්වීමට නියමිත වූ සියලු සේවකයින්ට ද ඉහත 2 වගන්තියෙන් ලබා දී ඇති ප්‍රතිපාදනවලට යටත්ව වයස අවු. 60 දක්වා සේවය කිරීමට පූර්ණ හිමිකම ඇති බවය.

පළමු පාර්ශ්වකරු විශ්‍රාම ගොස් ඇත්තේ 2014.03.14 දිනය. 2023.06.05 දින නඩු විභාගය හමුවේ එම පාර්ශ්වය සාක්ෂි ලබාදෙමින් ප්‍රකාශ කර සිටියේ වයස අවු. 60 දක්වා සේවය කිරීමට අවස්ථාව ලබාදෙන ලෙස තමා ඉල්ලීමක් කර ඇති හෙයින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මානව සම්පත් අංශ පරිපාලන නිලධාරීන්ගේ අත්සනින් පානදුර ඩිපෝ කළමනාකාර මහතා අමතා 2015 මැයි 18 දින දරන ලිපිය එවා තිබුණ බවයි. ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ඔහුගේ පුද්ගලික ලිපි ගොනුව සහ රහස්‍ය වාර්තාව ප්‍රධාන මානව සම්පත් කළමනාකරු වෙත යැවීම සඳහා තමා වෙත එවන ලෙස මානව සම්පත් කළමනාකරණ කොට්ඨාසයේ පරිපාලන නිලධාරි මහතා දන්වා තිබුණ බවයි. (A/27/2023 නඩු ගොනුවේ 98, 99 පිටු සහ එම ගොනුවේ පිටු අංක 27 හි පැ 07 ලේඛනය)

2015.03.18 දින සම්මුඛ පරීක්ෂණයකට පැමිණෙන ලෙස අළුත්ගම ඩිපෝ කළමණාකාරවරයා තැපැල් දෙපාර්තමේන්තු විදුලි පුවතක් මගින් තමා වෙත දන්වා එවා ඇති බව 2023.06.05 දින නඩු විභාගය හමුවේ පළමු පාර්ශ්වය සාක්ෂි දෙමින් ප්‍රකාශ කළේය. (ඒ 27/2023 නඩු ගොනුවේ 99 පිට සහ පිටු අංක 27 හි දක්වා ඇති පැ 08 ලේඛනය)

2023.07.20 දින නඩු විභාගයේ දී පළමු පාර්ශ්වයේ සිය සාක්ෂියෙන් දක්වා ඇත්තේ විශ්‍රාම යන්නට පෙර තමා අවු.60 දක්වා සේවය දීර්ඝ කරන ලෙස ඉල්ලීමක් නොකළ බවත් විශ්‍රාමයාමෙන් පසු නිකුත් කර ඇති චක්‍රලේඛය අනුව වයස 60 දක්වා සේවය කිරීමට තිබෙන නිසා පානදුර කාර්යාලයට අභියාචනයක් ඉදිරිපත් කළ බවත් ය. (ඒ 27/2023 නඩු ගොනුවේ 128 වැනි පිට)

නඩු විභාගය හමුවේ සාක්ෂි මෙහෙයවමින් දෙවන පාර්ශ්වය ප්‍රශ්න කළේ සේවය දීර්ඝ කිරීමට අදාළ පෝරමය මගින් එකී ඉල්ලීම සිදු කලාද යන්න ගැනය. පළමු පාර්ශ්වය සේවය දීර්ඝ කිරීම සඳහා නිසි අයදුම්පත මගින් ඉල්ලීමක් සිදු කර නොතිබුණා නම් සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව එම නුසුදුසුකම මත ඉල්ලීම ප්‍රතික්ෂේප කළ බව ඔහු වෙත දන්වා තිබිය යුතු වුවද එසේ සිදුකර නැත. යටත් පිරිසෙයින් නිසි පෝරමයක් අභියාචනාකරුට භාරදී එය පුරවා ඉදිරිපත් කරන ලෙස දැන්වීමේ යුතුකමක් පැවතිය ද එය ද පැහැර හැර ඇත.

2015 අංක 1 (01) දරන මානව සම්පත් කළමනාකරණ චක්‍රලේඛය බලාත්මක කර ඇත්තේ 2013.09.01 දින වන හෙයින් ද එම අවස්ථාව වන විට පළමු පාර්ශ්වය සේවයේ නිරතව සිටි පුද්ගලයකු වන හෙයින් ද කිසිදු ඉල්ලීමකින් තොරව වයස අවු. 60 දක්වා සේවයේ යෙදීමට ප්‍රතිපාදන එමගින් සළසා ඇති බැවින් ද වයස අවු. 60 දක්වා සේවයේ යෙදීම ඔහුගේ අපේක්ෂාව වී ඇති හෙයින් ද නිසි පෝරමය මගින් අයදුම්පත ඉදිරිපත්කර නොමැති නිසා එම අභියාචනය ප්‍රතික්ෂේප කරන බව පළමු පාර්ශ්වය වෙත දන්වා නොමැති හෙයින් ද පළමු පාර්ශ්වයට මෙහි දී අසාධාරණයක් සිදුව ඇති බවට මම තීරණය කරමි.

ඒ අනුව අවු. 57 සපුරා 2014.03.14 දින විශ්‍රාම යාමෙන් අනතුරුව ඔහුගේ වයස අවු. 60 පිරෙන 2017.03.13 තෙක් වසර තුනක හෙවත් මාස 36 ක කාලය ඔහු සේවයේ යෙදී සිටියා සේ සළකා විශ්‍රාම ගන්වා තිබුණ අවස්ථාවේ ගෙවා ඇති වැටුප පදනම් කරගෙන පළමු පාර්ශ්වය වෙත වන්දියක් ලෙස ගෙවිය යුතු බවට තවදුරටත් තීරණය කරමි. වැටුප් වර්ධක සළකා හිඟ වැටුප් ගෙවීමක් හෝ පාරිතෝෂික දීමනා ලබාදීමක් හෝ කිසිදු ව්‍යවස්ථාපිත දීමනාවකට හිමිකමක් නොමැත.

පළමු පාර්ශ්වය වෙත බේරුම්කරණ අධිකරණය (2023.06.05 දින පරීක්ෂණ වාර්තාවේ 17 පිට) සිදුකර ඇති ඉල්ලීම අනුව ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශයට අමුණා තිබෙන (ගොනුවේ 348 පිට) කළුතර සහකාර කම්කරු කොමසාරිස්වරයාගේ 2014.11.22 දින සහ කලු/පාරි/03/ඊ/270/2013 දරන ලිපියේ සඳහන් පරිදි පළමු පාර්ශ්වය විශ්‍රාම ගිය 2014.03.13 දින ඔහු ලබා ඇති මාසික වැටුප රු. 28075.00 ක් වන හෙයින් එම වැටුප පදනම් කරගෙන වයස 60 ඉක්මවා යන 2017.03.13 දින දක්වා වැටුප් ලෙස (පහත විස්තර කරන ආකාරයට) රු. 1,010,700.00 ක මුදලක් මෙම තීරණය *ගැසට් පත්‍රයේ* පළකර දින 30 ක් ඉක්ම යන්නට පෙර දෙවන පාර්ශ්වය පළමු පාර්ශ්වය නමින් කලුතර දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතුය.

| | | | |
|---|---|---|---|
| 2014.03.14 සිට 2015.03.13 (මාස 12) | = | 28075.00 x 12 = | රු. 336,900.00 |
| 2015.03.14 සිට 2016.03.13 (මාස 12) | = | 28075.00 x 12 = | රු. 336,900.00 |
| 2016.03.14 සිට 2017.03.13 (මාස 12) | = | 28075.00 x 12 = | රු. 336,900.00 |
| | | | රු. 1,010,700.00 |

මෙම තීරණය සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදානයක් බව තවදුරටත් සහතික කරමි.

**සිරි සිංගප්පුලි (එල්. එල්. බී.),**
බේරුම්කරු.

2024 පෙබරවාරි මස 16 වැනි දින දී ය.

EOG 03 – 0150

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.